**මධ්‍යම පළාත් සභාවේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දිස්පැන්සරි සහායක හා මධ්‍යස්ථාන භාරකරු III ශ්‍රේණියට (ප්‍රාථමික ශ්‍රේණිය) බඳවාගැනීම - 2025**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දිස්පැන්සරි සහායක හා මධ්‍යස්ථාන භාරකරු III ශ්‍රේණියට (ප්‍රාථමික ශ්‍රේණය) බඳවාගැනීමේ විවෘත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.පොදු සුදුසුකම්

1.1. අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර(සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06ක් සමත් වී තිබීම.

1.2. පළපුරුද්ද

අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පලපුරුද්දක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.(අදාල පලපුරුද්ද ලබාගත් ආයතනයෙන්, ලබාගත් සහතිකයක් මඟින් සනාථ කළ යුතුය)

1.3. පුහුණුව

තනතුරට හිමි ක්ෂේත්‍රයට අදාලව රජයේ ලියාපදිංචි ආයතනයක පාඨමාලාවක් හදාරා තිබීම හා ඒ සම්බන්ධයෙන් පුහුණුවක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ. .(අදාල පුහුණුව ලබාගත් ආයතනයෙන්, ලබාගත් සහතිකයක් මඟින් සනාථ කළ යුතුය)

1.4.වෙනත්

1.4.1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

1.4.2. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

1.4.3. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට(2026.01.07) පූර්වාසන්න වසර 03ක කාලය තුල මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.(අයදුම්කරුගේ පදිංචිය ඡන්ද හිමි නාම ලේඛනය මඟින් හෝ ග්‍රාම නිලධාරි සහතිකය මඟින් සනාථ කළ යුතුය.)

1.4.4. සෑම අයදුම්කරුවෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

1.4.5. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.5. වයස

1.5.1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

2. වැටුප් පරිමාණය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි PL 1 අනුව මෙම තනතුරු සඳහා හිමි මාසික වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු.40000-10×450-10×490-10×540-12×590-රු.61880/-

(ඉහත චක්‍රලේඛයේ උපලේඛණ IIහි සඳහන් පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඉදිරි වැටුප් ගෙවීම සිදු කරනු ලැබේ)

3. බඳවා ගැනිමේ කොන්දේසි

මෙම තනතුරට අදාළව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව බඳවා ගැනීමේ කොන්දේසි තීරණය වේ.

4. බඳවා ගැනීමේ ක්‍රමය

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

5.තනතුරෙහි රාජකාරි ස්වභාවය

5.1.දිස්පැන්සරි සහායක

කාර්යාලයේ අභ්‍යන්තර හා බාහිර පවිත්‍රතා කටයුතු හා සනිපාරක්ෂක කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම, ශල්‍ය උපකරණ හා ප්‍රතිකාර සඳහා භාවිතා කරන භාණ්ඩ විෂබීජහරණය කිරිම, පශ්චාත් මරණ පරීක්ෂණවලදි පශු වෛද්‍යවරයාට සහාය විම හා සත්ත්ව මළසිරුරු හා අපද්‍රව්‍ය බැහැර කිරිම, දිස්පැන්සරියේ හා ක්ෂේත්‍රයේ ශල්‍යකර්මවලදි හා පශු වෛද්‍ය නිලධාරීන් සතුන්ට ප්‍රතිකාර කිරීමේදි සහාය විම(සතුන් හැසිරවිම, උපකරණ සූදානම් කිරිම), කෘතිම සිංචන උපකරණ, කාර්යාලයට ලැබෙන ගව ශුක්‍ර වඩි හා දියර N2 භාර ගැනීම හා ආරක්ෂා කිරිම හා අවශ්‍යතාවය අනුව ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන සියළුම රාජකාරි ඉටුකිරිම.

5.2. මධ්‍යස්ථාන භාරකරු

කාර්යාලය සතු ගොඩනැඟිලි වාහන ඇතුළු භාණ්ඩවල ආරක්ෂාව පිළිබඳව වගකීමෙන් කටයුතු කිරිම, කාර්යාලය අවට පිරිසිදුව හා ප්‍රියමනාප ලෙස පවත්වාගෙන යාම, කාර්යාලයේ ආරක්ෂිත වැට නඩත්තු කිරිම, රජයේ නිවාඩු දිනවල හා කාර්යාලයිය වේලාවෙන් පසු කාර්යාලයට ලැබෙන දියර නයිට්‍රජන්, ගවශුක්‍ර වඩි හා අනෙකුත් භාණ්ඩ, උපකරණ විධිමත් ලෙස භාරගැනීම හා පශු වෛද්‍ය නිලධාරීන්ට භාරදිම හා පශු වෛද්‍ය නිලධාරි විසින් නියම කරනු ලබන වෙනත් රාජකාරි නිත්‍යානුකූලව ඉටුකිරිම.

6. අයදුම් කිරීමේ ක්‍රමය

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කොට 2026.01.07 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්,කෘෂිකර්ම හා ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය, අංක 1060, ගැටඹේ,පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාර දිය යුතුය.අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ.අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර ඇතුළත් කළ යුතුය.නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.තැපෑලේදී අස්ථානගතවන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වග කියනු නොලැබේ.

7. අයදුම්පත්‍රය පිරවීම සඳහා පොදු උපදෙස්

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව A 4 ප්‍රමාණයක කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-5 දක්වා කරුණු ද අනෙක් පිටුවල ඉතිරි ඡේද ද ඇතුලත් වන සේ අයදුම්පත සකස් කර ගත යුතුය.

7.1. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ මාණ්ඩලික නිලධාරියෙකු විසින් නිලමුද්‍රාව තබා සහතික කළ යුතුය.

7.2. යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබාදීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත.එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් තර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහකෙරෙනු ඇත.

7.3. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

8. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරිම/ තිරණය කිරිම මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් සතු වේ.

2025 දෙසැම්බර් මස 17
මධ්‍යම පළාත් කෘෂිකර්ම හා
සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය,
අංක 1060,ගැටඹේ, පේරාදෙණිය.

ලේකම්,
මධ්‍යම පළාත් කෘෂිකර්ම හා
සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**<u>මධ්‍යම පළාත් සභාවේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දිස්පැන්සරි සහායක හා මධ්‍යස්ථාන භාරකරු III ශ්‍රේණියට (ප්‍රාථමික ශ්‍රේණිය) බඳවාගැනීම - 2025</u>**

කාර්යාල ප්‍රයෝජනය සඳහා

01.1.1.මුලකුරු සමඟ නම:-......................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2. මුලකුරු සමඟ නම:-......................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.3. මුලකුරුවලින් හැඳින්වෙන නම(ඉංග්‍රීස් කැපිටල් අකුරෙන්) :-.............................................................

.......................................................................................................................................................

1.4. මුලකුරුවලින් හැඳින්වෙන නම(සිංහලෙන්/දෙමළෙන්) :-..................................................................

.......................................................................................................................................................

02. 2.1. ස්ථිර ලිපිනය(සිංහලෙන්/දෙමළෙන්) :-..........................................................................................

2.2. දුරකථන අංකය:-................................................................

03.3.1. උපන් දිනය:-................................................................

3.2. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට (2026.01.07)වයස:-අවු...............මාස...............දින...............

3.3. ජාතික හැඳුනුම්පත් අංකය:- | | | | | | | | | | | | |

04. ස්ත්‍රී/ පුරුෂභාවය:- ස්ත්‍රී [ ] පුරුෂ [ ]

05.අයදුම්කරුගේ ස්ථිර පදිංචිය පිළිබඳ තොරතුරු

| ඡන්ද හිමි නාම ලේඛනය අනුව පදිංචිය | 2023 | 2024 | 2025 | 2026.01.07 දක්වා |
|---|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාශය | | | | |
| ඡන්ද ප්‍රදේශය | | | | |
| ඡන්ද කොට්ඨාශය | | | | |
| ග්‍රාම නිලධාරි කොට්ඨාශ අංකය | | | | |
| ගෘහ අංකය | | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | | |

06. අධ්‍යාපන සුදුසුකම්:- අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර

6.1. විභාගයට පෙනී සිටි වර්ෂය:-..........................  විභාගයට පෙනී සිටි වර්ෂය:-..........................

6.2. විභාග අංකය :- .....................................  විභාග අංකය :- .....................................

6.3. ප්‍රතිඵල :- පළමුවර  ප්‍රතිඵල :- දෙවනවර

| විෂය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

| විෂය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

6.4. අතිරේක අධ්‍යාපන සුදුසකම්:- ...........................................................................................................
.............................................................................................................................................

අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ නිවැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනිමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරිමට යටත් වන බවත් මා දනිමි.

..........................................  ..........................................

දිනය  අයදුම්කරුගේ අත්සන

07. අයදුම්කරුගේ අත්සන සහතික කිරිම

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..........................................................................................මහතා/මිය/ මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය 2025.12.  දින මා ඉදිරිපිටදි ඔහුගේ/ඇයගේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

........................................................

සහතික කරන අයගේ අත්සන

සහතික කරන අයගේ සම්පූර්ණ නම:-..................................................

තනතුර :-..................................................

ලිපිනය :-..................................................

නිල මුද්‍රාව :-..................................................

රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.

ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ..............................................................මයා/මිය/මෙනවිය...................

වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති ලිපිලේඛන අනුව නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

.......................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :-......................................

නම :-......................................

පදවි නාමය:- ......................................

නිල මුද්‍රාව :- .......................................